# සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම - 2011/12

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 1.2.5 (අ) ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණ හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාගමේ බොල්ණය ප්‍රතිපත්තිය අනුව වර්ෂ 05 ට වැඩි ණය සඳහා 2.5% ක ප්‍රතිපාදන සැලසිය යුතු වුවත් රු.36,428,942 ක් හෙවත් මුල් ණය ශේෂයෙන් 63.7% ක් වූ වර්ෂ 05 ඉක්මවූ ණයගැති ශේෂ සඳහා ප්‍රමාණවත් ලෙස බොල්ණය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ). තොග ආනයනය කළ දිනට පැවති විනිමය අනුපාතයට වඩා වෙනස් අනුපාතයකට අවසාන තොගය අගය කිරීම නිසා තොග වටිනාකම රු.10,173,988 කින් වැඩියෙන් දැක්වුණි.

(ආ). අවසාන තොගය මත සහනාධාරය රු.517,005,334 ක් වැඩියෙන් දැක්වීම නිවැරදි කිරීමේදී පොහොර සහනාධාර ගිණුමට බැර කිරීම වෙනුවට විනිමය අලාභය ගිණුමට බැර කිරීම හේතුවෙන් අදාල ගිණුම් එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දැක්වුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය තුල ආනයන බිල්පත් පියවීමේදී පොහොර ආනයන ගිණුමෙහි ආනයනය කළ පොහොර වටිනාකම වෙනුවට ආනයන බිල්පත් පියවූ දිනවල වටිනාකම දැක්වීම නිසා විනිමය අනුපාතය වෙනස් වීම මත ඇති වූ රු.154,840,852 ක විනිමය අලාභය මූල්‍ය ප්‍රකාශනවලන් හෙළිදරව් නොකෙරුණි.

(ඈ). 2007 වර්ෂයේදී ණය පදනම මත පුද්ගලික සමාගමකින් ලබාගත් රු.7,269,820 ක් වටිනා පොහොර තොගයක් සමාලෝචිත වර්ෂයේ පොහොර මිලදී ගැනීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ). 2011 මැයි සිට 2012 පෙබරවාරි දක්වා කාලය තුළ දිගුකාලීන ණය සඳහා බැංකුව විසින් අයකළ පොළී සහ දඩ මුදලට වඩා රු.1,237,639 ක් වැඩියෙන් භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කරවාගෙන තිබුණු අතර මෙම මුදල ආදායමක් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

---------------------------------

ණයගැති ලෙජරයේ ශේෂයන් සහ ශේෂ සනාථ කිරීම් අතර එකඟ නොවීම් අවස්ථා 28 ක් නිරීක්ෂණය වූ අතර ඉන් අවස්ථා 23 කට අදාල රු.14,611,538 ක් වූ ණය ශේෂ, ණයගැතියන්ගේ පොත් පත් අනුව ශූන්‍ය ශේෂයන් බව ඔවුන් විසින් දන්වා තිබීම හේතුවෙන් එම ණය ශේෂයන්හි නිවැරදිතාව සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමට පත්වීමට නොහැකි විය.

### 1.2.4 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්

-------------------------------------

නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ). 2012 මාර්තු 31 දිනට ණයගැතියන් 150 දෙනෙකුට අදාල හිඟ ණය ශේෂය රු.45,877,587 ක් වූ අතර එහි ඇතුළත් 1994 ට පෙර සිට පැවත එන රු.23,803,076 ක ශේෂය අයකර ගැනීම හෝ කපා හැරීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ආ). 1997 වර්ෂයේ පොහොර සමාගම නැවත ආරම්භ කිරීමෙන් පසුව බිහිවූ වසර 07 කට වැඩි ණයගැතියන් 74 දෙනෙකුගෙන් රු.12,625,866 ක් අයවීමට තිබූ නමුත් රු.5,833,063 ක් වූ ණයගැතියන් 06 ක් සම්බන්ධයෙන් පමණක් ණය අයකර ගැනීමේ නීතිමය කටයුතු සිදුකර තිබුණි.

(ඇ). සේවක ණය ශේෂය තුළ වූ වසර 18 කට වඩා පැරණි සේවය හැරගිය, සේවය අත්හිටවනු ලැබූ හා වැඩ තහනමට ලක්වූ සේවකයන්ගෙන් අයකරගත යුතු ණය ශේෂය රු.3,546,999 ක් විය.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ). පොහොර තොග | 3,282,865,947 | භෞතික තොග සත්‍යාපණ වාර්තා |
| (ආ). ඉඩම් | 90,000,000 | ඔප්පු හෝ නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීම සඳහා අවශ්‍ය වෙනත් ලියකියවිලි |

### 1.2.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති,රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | |
| i). 2003 ජනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 9.3.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේදී අනුමත බඳවා ගැනීමේ පටිපාටියකින් තොරව බඳවා ගැනීම් 15 ක් සිදුකර තිබුණි. |
| ii). 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 1.5 ඡේදය සහ 2011 සැප්තැම්බර් 15 දිනැති අංක 58(2) දරන චක්‍රලේඛයේ 8.3.5 ඡේදය | - නිල වාහන සඳහා හිමිකම් නොමැති වැඩ කළමනාකරුට හා ප්‍රවාහන කළමනාකරුට පෞද්ගලික වාහන රාජකාරි කටයුතු සඳහා යොදා ගැනීම වෙනුවෙන් රු.35,000 ක මාසික දීමනාවක් ලබාදී තිබුණි.<br>- කාර්යාලය හා නිවස අතර ප්‍රවාහනය සඳහා නිල ප්‍රවාහන පහසුකම් හිමිකම නොමැති නිලධාරීන් 06 දෙනෙකුට ද කාර්යාලයේ සිට නිවෙස බලා යාමට හා ඒමට පහසුකම් සලසා තිබූ අතර එම වාහන අදාල නිලධාරීන් විසින්ම පදවාගෙන යනු ලබන බව |

| | |
|---|---|
| | නිරීක්ෂණය විය. |
| iii). 2003 ජුනි 02 දිනැති අංක පීඩ් 12 දරන චක්‍රලේඛයේ 8.3.3 ඡේදය | භාණ්ඩාගාරය විසින් අනුමත කල දිරිදීමනා යෝජනා ක්‍රමයක් නොමැතිව දිරිදීමනා වශයෙන් 2011/12 වර්ෂයේදී රු.8,178,899 ක් ගෙවා තිබුණි. |
| (ආ). 2000 ජුනි 27 දිනැති අංක:පීඑෆ්/පීඊ/9 දරන රාජ්‍ය මුදල් හා 2000 මැයි 02 දිනැති අංක:බීඩී/පීඊ/3/2000 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තු චක්‍රලේඛ | රාජ්‍ය සමාගම්වල මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට පෙර අදාල අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගතයුතු වුවත් එසේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතුවල රු.464,694,252 ක් ආයෝජනය කර තිබුණි. |
| (ඇ) 2009 ඔක්තෝබර් 30 දිනැති අංක 4/5/1 දරන ජාතික පොහොර ලේකම් කාර්යාල චක්‍රලේඛය | සහනාධාර පොහොර ණය පදනම මත අලෙවි කල නොහැකි නමුත් ඊට පටහැනි ලෙස 2011 නොවැම්බර් 24 දින රු.282,960 ක් වූ පොල් පොහොර පුද්ගලයකුට ණයට ලබාදී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී සමාගමේ මෙහෙයුම්වලින් රු.264,859,852 ක බදු පෙර ශුද්ධ ලාභයක්වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.326,513,860 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.61,654,008 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

සමාගමේ විකුණුම් සහ අනෙකුත් ආදායම් 13% කින් පහත වැටීම මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ). සමාගම විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රාදේශීය ගබඩා ගණන 16 ක් වූ අතර ගබඩා 11 ක් පරිහරණය සම්බන්ධයෙන් ඒවායේ හිමිකරුවන් සමග ලිඛිත ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ආ). 2011/12 වර්ෂය වෙනුවෙන් ගබඩා රක්ෂණය සඳහා රු.1,302,266 ක රක්ෂණ වාරිකයක් ගෙවා තිබුණ ද රක්ෂණ සමාගම විසින් පෙන්වා දී තිබුණු ගබඩාවන්හි පවත්නා අඩුපාඩු පිළිසකර කර නොමැති බැවින් වර්ෂය තුළ සිදු වූ රු.455,621 ක තොග හානි සම්බන්ධයෙන් රක්ෂණ වන්දි අයකරගත නොහැකි වී තිබුණි.

(ඇ). 2009/10 වර්ෂයේ ආදායම් අඩුවෙන් පෙන්වීම ගැලපීම මත වැඩිපුර ගෙවිය යුතු වූ රු.262,257,930 ක බදු මුදල වෙනුවෙන් නව ආදායම් බදු තක්සේරුව යාවත්කාලීන කර එම ප්‍රමාණය දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ). කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් වාහන 4 ක් වර්ෂ 10 කටත් වැඩි කාලයක සිට පොහොර සමාගම වෙත ලබාදී ඇති බව නිරීක්ෂණය වූ අතර එම වාහන නිසි පරිදි පවරාදී නොමැති හෙයින් ආයතනයේ වත්කම් ලෙස හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සමාගම සතුව සහනාධාර පොහොර ආනයනයේ හා තොග පවත්වාගෙන යාමේ ක්‍රමවත් සැලැස්මක් නොතිබුණු අතර එක් එක් කන්නයේ පොහොර අවශ්‍යතාව මත පදනම් කරගත් අවම තොග මට්ටම්, උපරිම තොග මට්ටම් හා යළි ඇනවුම් මට්ටම් තීරණය නොකර පොහොර ආනයනය කිරීම හේතුවෙන් එක් එක් කන්නයක් අවසානයේදී ප්‍රධාන පොහොර ගබඩාවල අතිරික්ත පොහොර තොග පැවතුනි. උදාහරණ ලෙස 2010 හා 2011 වර්ෂවල

එක් එක් කන්නයක් අවසානයේ ප්‍රධාන ගබඩාවල පවතින තොගය ඊළඟ කන්නයේ අවශ්‍යතාවයෙන් දළ වශයෙන් යූරියා 37% ක්, එම්.ඕ.පී. 78% ක්, ටී.එස්.පී. 46% ක් ලෙස නිරීක්ෂණය විය.

### 3.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

දිනකට මෙට්‍රික් ටොන් 480 ක ධාරිතාවයකින් පොහොර මිශ්‍ර කර නිෂ්පාදන කටයුතු කළ හැකි වටිනාකම රු.3,750,000 ක් වූ පොහොර මිශ්‍රණ යන්ත්‍ර 3 ක් ගබඩා සංකීර්ණයේ ස්ථානගතව පැවති අතර 2008 වර්ෂයෙන් පසුව මෙම යන්ත්‍ර 03 ප්‍රයෝජනයට ගෙන නොතිබුණ.

### 3.4 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව සමාගමේ කාර්ය මණ්ඩලය සඳහා බඳවාගෙන තිබූ සාමාජිකයන් 03 දෙනෙකු රේඛීය අමාත්‍යාංශයේ සේවය සඳහා යොදවා තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ වැටුප් හා වේතන ලෙස රු.757,862 ක වියදමක් දරා තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනයන්

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාර ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවත් 2011/2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 5 දින 20 ක ප්‍රමාදයකින් පසුව 2012 නොවැම්බර් 21 දින විගණනය සඳහා ඉදිරිපත්කර තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂනය වූ අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ). පොහොර තොග පාලනය හා බෙදාහැරීම.

(ආ). වාහන පරිපාලනය.

(ඇ). ණයගැතියන්ගේ හිඟ ණය ශේෂ අයකර ගැනීම.

(ඈ). කොන්ත්‍රාත් පරිපාලනය.